# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ආර්ථික සේවා ගාස්තු
## (සංශෝධන)

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2013 මාර්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 පෙබරවාරි මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[212 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 007076—1,000 (2013/03)

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

**2 වන වගන්තිය :** මේ වගන්තිය මගින් 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශේධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ-

(අ) යම් රාජ්‍ය සංස්ථාවක් විසින් නොමිලයේ යම් සේවයක් සැපයීම සඳහා පාර්ලිමේන්තුව විසින් ඒකාබද්ධ අරමුදලින් සම්මත කරනු ලබන අරමුදල් හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් සලස්වා දෙනු ලබන යම් ණය මුදලක් ; සහ

(ආ) යම් කාබනික පොහොර නිෂ්පාදකයෙකු විසින් එම පොහොර විකිණීමෙන් ලැබෙන මුදල්,

ආර්ථික සේවා ගාස්තුවල කාර්ය සඳහා පිරිවැටුම යන්නෙන් බැහැර කිරීම වේ.

**3 වන වගන්තිය :** මේ වගන්තිය මගින් 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ ආර්ථික සේවා ගාස්තු වලින් ශ්‍රී ලංකා මහ බැංකුව නිදහස් කිරීම වේ.

එල්.ඩී.-ඕ. 1/2013

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** මේ පනත 2013 අංක  දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර 2013 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2006 අංක 13 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** 2012 අංක 11 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එකී උපවගන්තියේ (අ) ඡේදයෙහි අතුරු විධානයේ "එම කාර්තුව සඳහා අදාළ පිරිවැටුම" යන වචන වෙනුවට "යම් පිරිවැටුමකින් ලැබෙන ලාභය ආදායම් බද්දෙන් නිදහස් කර ඇද්ද, එකී පිරිවැටුම හැර එම කාර්තුව සඳහා අදාළ පිරිවැටුම" යන වචන ආදේශ කිරීමෙන්;

(2) (ආ) ඡේදයේ (අ) අනුඡේදයේ (ix) අයිතමයේ "භාණ්ඩ විකිණීමෙන් උපචිත මුදල් ; සහ" යන වචන වෙනුවට ''භාණ්ඩ විකිණීමෙන් උපචිත මුදල්;'' යන වචන ආදේශ කිරීමෙන්;

(3) (ආ) ඡේදයේ (අ) අනුඡේදයේ (ix) වන අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අයිතමයන් එකතු කිරීමෙන් :-

"(x) ආණ්ඩුව වෙනුවෙන් යම් රාජ්‍ය සංස්ථාවක් විසින් නොමිලයේ යම් සේවාවක් සැපයීම සඳහා ඒකාබද්ධ අරමුදලින් පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන අරමුදල් හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් සලස්වා දෙනු ලබන යම් ණය මුදලක් ; සහ

(xi) යම් කාබනික පොහොර නිෂ්පාදකයකු විසින් එම පොහොර විකිණීමෙන් ලැබෙන මුදල් ; සහ".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**3.** 2011 අංක 11 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ "තැනැත්තා" යන යෙදුමේ අර්ථ නිරූපණය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි (ඊ) ඡේදයේ "ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් ;" යන වචන වෙනුවට "ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් ; සහ" යන වචන ආදේශ කිරීමෙන් සහ

(2) එහි (ඊ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්

"(උ) ශ්‍රී ලංකා මහ බැංකුව ;"

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.